# ඔකී



ඔකිත්මා වික්‍රමරත්න

# ඔකී

ඔකිත්මා වික්‍රමරත්න

කතෘ

## පළමු දිග හැරීම

මහාමායා බාලිකා විදුහල

7 - A ශ්‍රේණිය

2025.02.22

ISBN **අංකය** - 978 - 624 - 208 - 695 - 8

# පිදුම

**මම මේ ලෝකේ වැඩියෙන්ම ආදරේ කරන මගේ අප්පච්චිට**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ඔකී

ඔකී පුංචි මල් කැකුළියක් මේ පුංචි මල් කැකුළියගේ අම්මයි තාතාතයි ජීවත් වුණේ ලොකු කැළෑවක් මැද පුංචි නිවසක. දවසක් මේ දෙන්නා කෑම ටිකක් හොයා ගන්න කියලා කැලෑව මැදින් ටිකක් එහාට ගියා.



ඒ දවස්වල ඔකී පැටියා හිටියේ එයාගේ අම්මාගේ බන්ඩියේ ඇතුළෙ. ඔන්න ඉතින් මෙහෙම දවසක් යනකොට අම්මට ලොකු මහන්සියක් දැනුණා. මේ අම්මා ටිකක් වෙලා ගහක් යට වාඩි වෙලා වෙහෙස නිවා ගත්තා ඉතින් මෙහෙම දෙන්නා යන අතරදී ඔකීගේ අම්මට තද වතුර තිබහක් දැනුණා. තාත්තා ගිහින් ළඟ පාත වතුර තියෙන තැනක් හෙව්වා බලනකොට ඔකීගේ තාත්තාට හම්බවෙනවා පොඩි උල්පතක්.



අනේ ඉතින් මේ ඔකීගේ තාත්තා ඒ උල්පතෙන් වතුර ටිකක් අරගෙන ගියා. තාත්තා අම්මාට වතුර ටිකක් පෙව්වා එකෙන් අම්මාට අර තිබුණ වතුර තිබහ නැති වුණා ඊට පස්සේ මේ දෙන්නා පලතුරු කඩාගෙන ගෙදර එන අතරතුර දී අපේ පුංචි ඔකී මේ ලෝකයට බිහි වුණා.

ඔන්න ඉතින් ඔහොම ඉද්දී දවසින් දවස ගත වුණා. දැන් අපේ ඔකීට අවුරුදු දෙකක් සම්පූර්ණ වුණා විතරයි. මේ තුන්දෙනා ගියා දවසක් ඇවිදින්න. මේ යන අතරමගදී මේ අයට හම්බවෙනවා වෘකයෙක්, තාත්තා දුවටයි, අම්මාටයි කියනවා ''දුවන්න දුවන්න දුවන්න......මම මු ගැන බලාගන්නම්.'' කියලා. කැකුළිගේ අම්මා ගොඩක් අසරණ වෙලා. ඉතින් ඔකීව අරගෙන අම්මා දිව්වා. හැබැයි වැඩක් වුණේ නම් නෑ . මේ ගොල්ලනගේ ගෙදරට තව ගොඩක් දුරයි. ඒ නිසා ඔකීගේ අම්මා ඔකීගේ කරට එයාගේ බෙල්ලේ තිබ්බ දියමන්තියෙන් හදාපු මාලය. ඔකීගේ කරට දාලා ගහක බෙනයක් ඇතුලේ තිබ්බා. තියලා ඔකීට කිව්වා ''මේ මාලයෙන් ඔයාව සෑම තැනකම ආරක්ෂා කරයි. ඔයාට ආලෝකයක් ලබා දෙයි'' කියලා ඔකීගේ අම්මා යන්න ගියා.



අම්මාත් තාත්තා සමඟ වෘක්කයාට එරෙහිව සටන් කරා. වෘක්කයා ඉතා විශාලයි. මේ සටන් අවසන් වුයේ අපේ ඔකීගේ අම්මයි තාත්තයි සමු ගත්තාට පසුවයි.



මේ කැලෑවේ නපුරුම නපුරු මන්තරකාරියක් හිටියා.



මේ මන්තරකාරිය අර බෙනයේ හිටපු ඔකීව දැක්කා. ඉතින් මේ නපුරු මන්තරකාරිය හෙමිහිට හෙමිහිට අර බෙනයට ළං වුණා. ඊට පස්සේ අපේ ඔකීව අතට ගත්තා එයාට එනකොටම එයාගේ ඇස්වලට දිස්නයක් ආවා. බලනකොට මොකක්ද දන්නවාද යාළුවනේ, අර දියමන්ති මාලය දිලිසෙනවා. මන්තරකාරියට එක ගන්න ආස හිතුණා. ඒ නිසා ඔකීව වළාකුළු අස්සෙන් ගස් අස්සෙන් එයාගේ උසම උස කුළුනට එක්කර ගෙන ගියා.

දැන් ඔකීට වයස අවුරුදු දහයයි. දැන් ඔකීට හැම දෙයක් ම පුළුවන්. රසට උයන්න,ලස්සනට ගොතන්න, මහන්න,චිත්‍ර අදින්න, ලස්සනට අකුරු ලියන්න, මිහිරිව ගීත ගයන්න, ඖෂධ වර්ග සොයන්න,වගේ වැඩ මේ වයසේ දීම ඔකීට කරන්න පුළුවන් වෙලා තියෙනවා. මායානාරිය රන්න එන්න ම නපුරු වුණා. ඔකීට ගොඩාක් කරදර වුණා.

නමුත් ඔකී ඉතා කරුණාවන්ත අයෙක්. ඒ නිසා එයා පුළුවන් තරම් ඉවසුවා. මායාකාරියට අම්මා කෙනෙක්ට වගේම සැලකුවා.මායා කාරියට වෛර කරේ නෑ.හැමදාම  මායාකාරියව හොඳින් බලා ගත්තා.



**කා**ලය ගත වෙලා ගියා දැන් ඔකීට අවුරුදු දහසයයි. ඔකී හරිම ලස්සනයි. හරියට නිකං තරුවක් වගේ.හඳක් වගේ රත්තරන් පාටයි. කොණ්ඩය බිමට ම දිගයි. හැමෝගෙම සිත් ඇදෙන නිල් පාට ඇස් දෙකක් තිබ්බා. දවසක් දා මේ මන්තරකාරිය ඔකීව ගිහින් කරුවල කාමරයකට දැම්මා. ඒ කාමරය ඇතුලේ හරි අමුතු සද්ද ඇහෙනවා. හරිම සීතලයි. ඔකී අඬන්න පටන් ගත්තා. ටිකක් වෙලා යද්දී කාමරයෙන් ලොකු එළියක් විහිදෙන්න පටන් ගත්තා එළිය එන්නේ ඔකීගේ මාලයෙන් ඒ එළියෙන් ඇය යතුර හොයා ගත්තා. ඔකී ඉක්මනින් ම දොර ඇරගෙන එළියට පැන ගත්තා. යා



ඔකී !

ඔකී !

කව්දෝ හීන් හඬින් කතා කරනවා

කවුද මේ ?

චුටි බට්ටිච්චෙක්

චුටි කුරුළු පැටියෝ

ඇයි මේ ?

කොහෙන්ද ආවේ?

එන්න

එන්න

අම්මා එයාට කථා කරනවා.

අම්මා?

“ ඔකී ඔයාගේ අම්මා මේ ඖෂධ හල ඔයාට දෙන්න කිව්වා. ඔයා කවදහරි එන බවත් කිව්වා. ඔයා මුළුරටට ම උදව් කරන හොඳ වෛද්‍යවරයෙක් වෙන්න. දැන් එතන සතුන්ටත් බෙහෙත් කරන මිනිසුන්ටත් බෙහෙත් කරන මහා විශාල මන්දිරයක් වී තිබේ. දැන් එහි මහා විශාල රෝහලක් ඉදි වී තිබේ. තව පසකින් ඇය විසින් ම කෑම ආහාර සපයන හෝටලයක්ද සාදා තිබේ. ඇය දැන් ප්‍රධාන වෛද්‍යවරිය වන අතර ඇය සමඟ බොහෝ වෛද්‍යවරුන් වැඩ කරති.



**නිමි.**



# ඔකිත්මා වික්‍රමරත්න

**කතෘ**

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**ISBN අංකය - 978 - 624 - 208 - 695 - 8**